සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025.01

Learning Resource Center R De Mazenod College Kandana
18113

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න තෝරා ගතයුත්තේ ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් කොටසිනි.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරමත ලියන්න.

01. කඹ ඇදීමේ ක්‍රියාකාරකමේ දී ............................ භාවය නිරූපණය වේ. (සතුට/ උත්සාහය)
02. රත්තමාලී දෙව්දුව සම්බන්ධ රන් තෙළඹු වර්ණනාවේ කවි ගායනා කෙරෙන්නේ .................... නැටුමේදී ය. (කුළු/ තාලම්)
03. මුල් යුගයේ වන්නම් රචනය වී ඇත්තේ ........................................ සඳහා ය. (නර්තනය/ ගායනය)
04. උපත් කතා දෙකක් සමානව දක්නට ලැබෙන ශාන්තිකර්ම දෙක වන්නේ .............................. ය. (දෙවොල්මඩුව හා පහන් මඩුව/ කොහොඹා කංකාරි ශාන්තිකර්මය හා දෙවොල් මඩුව)
05. "යන්ට සොඳයි ශ්‍රී මහා බෝ අනුරපුරේ" කවි පදය ............................................. කවි ගායනය ගායනාවන්ට අයත් වේ. (තාලම්/ තලමල වරුණ)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා A කොටසට ගැලපෙන නිවැරදි පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| A කොටස | B කොටස |
|---|---|
| 06. පුටුව සරසලයි මම සැල කරන්නේ | මර්සලින් ජයකොඩි පියතුමා |
| 07. වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසයේ | කුලු නැටුමේ කවියකි |
| 08. ගිරාගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකි. | මල්යහන් කවියකි. |
| 09. රන්ගිරි මුදුනේ හිරු බබලන්නේ. | තාලම් නැටුම් කවියකි. |
| 10. සඳ වට තරු වැල් ඇවිදින් කල එළි සද්දේ. | මල්යහන් කවියකි. |
| | ජේ. ඊ. සේදරමන් මහතා. |

- පහත දී ඇති ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් හරි ලකුණ (✓) ද, වැරදි නම් (✗)ද පහත වරහන තුළ යොදන්න.

11.  රූප සටහනේ දක්වා ඇති සැරසිලි අංගය නිර්මාණය කිරීමට ගොප් කොළ භාවිතා කරයි. ( )
12. නම්‍යතා අභ්‍යාස කිරීමෙන් කායික සංවර්ධනය ඇති කෙරේ. ( )
13. චරිත නිරූපණයේ දී "ගයක්" නිරූපණය කිරීම ස්ථිතික චලනයකි. ( )
14. "සම ගුණ" ලෙස හැඳින්වෙන්නේ මධ්‍ය ලයයි. ( )
15. අලංකාර මාත්‍රා නර්තනය කිරීමෙන් ප්‍රායෝගික කුසලතා වර්ධනය නොවේ. ( )

## උඩරට - II කොටස

- ප්‍රශ්න අංක 16 සිට 20 නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16. උඩරට නර්තනයේ වන්නම් නටා අවසන් කරනුයේ,
    i) කලාසමෙනි. ii) කස්තිරමෙනි iii) ඉරට්ටියෙනි. iv) සීරුමාරුවෙනි

17. "උඩරට නැටුම් කලාව" ග්‍රන්ථය රචනා කරනු ලැබුවේ කවුරුන්ද?
    i) එම්. එච්. ගෝමිස් මහතා ii) නිත්තවෙල ගුණයා මහතා
    iii) රද්දැල්ලෙ පොඩි මහත්මයා මහතා iv) ජේ. ඊ සේදරමන් මහතා

18. කොහොඹ කංකාරිය ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙකි,
    i) දෙවොල් දෙවි - පත්තිනි දෙවියන්
    ii) කොහොඹ දෙවියන් - දෙවොල් දෙවියන්
    iii) අලුත් කොහොඹා දෙවියන් - මහ කොහොඹ දෙවියන්
    iv) අලුත් කොහොඹා දෙවියන් - කතරගම දෙවියන්

19. "ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු..." යන පදයේ ඉතිරි පද කොටස වේ.
    i) යන්නෙත් තොසින් තිදෙන සමගා ii) ගත් සිත් තොසත් පැවිදි අංගා
    iii) මුත් කන්තකත් වේය තුරගා iv) ගෙන් සෙන් රැගත් නෙර්ත අංගා

20. උඩරට නර්තන සම්ප්‍රදායේ ආධුනිකයකු ශිල්පීයත්වය ට පත්වීමේ අවස්ථාව හඳුන්වන්නේ මේ නමිනි,
    i) සිලම්බු මංගල්‍යය
    ii) හිස් වෙස් තැබීමේ මංගල්‍යය - ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍යය
    iii) මඩු බැයීමේ මංගල්‍යය
    iv) ගුරුවරම් දීමේ මංගල්‍යය

## පහතරට - III කොටස

16. පහතරට වන්නමක් අවසන් කරනුයේ,
    i) කස්තිරමෙනි. ii) ඉරට්ටියෙනි. iii) කලාසමෙනි. iv) සීරුමාරුවෙනි.

17. නාග කන්‍යා හා ගිනි සිසිල යන නර්තනයන් වේදිකාවට උචිත ලෙස රංග විලාසය නිර්මාණය කළේ කවුරුන්ද?
    i. එස්.එච් සවරිස් සිල්වා මහතා ii. ජේ. ඊ. සේදරමන් මහතා
    iii නිත්තවෙල ගුණයා මහතා. iv එම්.එම් ගෝමිස් මහතා

18. දෙවොල් මඩුවේ පුද ලබන ප්‍රධාන දෙවිවරු දෙදෙනෙකි,
    i කතරගම දෙවියන් හා අලුත් කොහොඹ දෙවියන්
    ii කොහොඹ දෙවියන් හා දෙවොල් දෙවියන්
    iii පත්තිනි දෙවියන් හා දෙවොල් දෙවොල් දෙවියන්
    iv කාලි දෙවියන් හා දෙවොල් දෙවියන්

19. "නම කළ විකුන් නැර පළ කළ....."කවි පදයේ ඉදිරිපද කොටස වෙයි.
    i රොසින් නේක කුලවර සවන් සහස නදිනේ ii ඔවුන් සැම සේකර කරන් සුරිඳු සරණේ
    iii එවන් මුහුල බලයෙන් යුද ට පිවිස එදිනේ iv කියන් ලෝක සතරක දෙවන් ඉසුරු නිතිනේ

20. පහතරට නර්තන සම්ප්‍රදායේ ආධුනිකයෙකු ශිල්පියභාවයට පත්වීමේ අවස්ථාව හඳුන්වන්නේ මේ නමිනි,
    i සිලම්බු මංගලා
    ii මඩුබැසීමේ මංගලා
    iii ගුරුවරම් දීමේ මංගලා
    iv හිස වෙස් බැඳීමේ මංගලා - ශීර්ෂාභරණ පැළඳවීමේ මංගල්‍යය

## සබරගමු - IV කොටස

16. සබරගමු නර්තනයේ වන්නමක් අවසන් කරනුයේ,

i ඉරට්ටියෙනි　　ii කලාසමෙනි　　iii කස්තිරමෙනි　　iv සීරුමාරුවෙනි

17. 1947 වර්ෂයේ දී සබරගමු නර්තනය ඉගැන්වීම සඳහා කලායතනයක් ආරම්භ කළේ කවුරුන්ද?

i හීන් නිලමේ මහතා　　ii එස්. එච් සව්රිස් සිල්වා මහතා

iii එම්. එච් ගෝමිස් මහතා　　iv රද්දැල්ලේ පොඩි මහත්තයා මහතා

18. දෙවොල් මඩුවේ පුදලබන ප්‍රධාන දෙවිවරු දෙදෙනෙකි.

i කතරගම දෙවියන් හා අලුත් කොහොඹ දෙවියන්

ii කොහොඹ දෙවියන් හා දෙවොල් දෙවියන්

iii පත්තිනි දෙවියන් හා දෙවොල් දෙවොල් දෙවියන්

iv කාලි දෙවියන් හා දෙවොල් දෙවියන්

19. "ඉද දෙපස වැඳ එකල අවසරය ....."කවි පදයේ ඉදිරිපද කොටස වෙයි.

i ගෙන එසඳ කියන් කවි දැන එතන වාඩි　　ii රගුම් කරන ඇත්තෙන් කිවින් පිරිවරා

iii බැලුම් කරන ඇත්තෙන් කවින් පිරිවරා　　iv කිම නෙක පැවසූ සොඳ ලෙසින් බැලුණාඩි

20. සබරගමු නර්තන සම්ප්‍රදායේ ආධුනිකයෙකු ශිල්පීයභාවයට පත්වීමේ අවස්ථාව හඳුන්වන්නේ මේ නමිනි,

i සිලම්බු මංගලා　　ii මඩුබැසීමේ මංගලා

iii ගුරුවරම් දීමේ මංගලා　　iv හිස වෙස් බැඳීමේ මංගලා - ශීර්ෂාභරණ පැළඳවීමේ මංගලාය

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න (02) දෙකකට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන (03) තුනකි.**

01. i) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ තුනක් ලියන්න. (ල:3)
ii) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න. (ල:2)
iii) එම වාද්‍ය භාණ්ඩයේ වාදනය වන අවස්ථා දෙකක් ලියන්න. (ල:2)
iv) සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය රූප සටහනකින් දක්වන්න. (ල:3)

02. i) තනි තිතේ ප්‍රභේදයක් නම් කරන්න. (ල:3)
ii) ඔබ දන්නා දෙතිතේ ප්‍රභේදයක් නම් කර, එයට අදාල බෙරපදයක් ලියන්න. (ල:3)
iii) "ළමා ලියෝ ගවසාමල් වරල පිටින්" කවි පදය මාත්‍රා 3+3 තනි තිතට ප්‍රස්ථාර ගත කරන්න. (ල:4)

03. i) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි දෙකක් නම් කරන්න. (ල:2)
ii) දෙවොල් මඩු ශාන්තිකර්මයේ නර්තනාංග දෙකක් ලියන්න. (ල:2)
iii) පහන් මඩු ශාන්තිකර්මයේ නාට්‍යාමය අවස්ථා දෙකක් ලියන්න. (ල:2)
iv) ඔබ ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මයේ උපත් කතාව කෙටියෙන් ලියන්න. (ල:4)

04. "කතරගම දේවාල පෙරහැර සියලු ජනයාගේ ආගමික පෙරහැරකි."
i) කතරගම දේවාල පෙරහර පවත්වනු ලබන මාසය නම් කරන්න. (ල:2)
ii) කතරගම දේවාලයේ සාම්ප්‍රදායික වශයෙන් වාර්ෂිකව පැවැත්වෙන ප්‍රධාන මංගලා උත්සව තුන ලියන්න. (ල:3)
iii) දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහා සිදුකෙරෙන දුෂ්කර කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ල:3)
iv) කතරගම දේවාල පෙරහැරේ දක්නට ලැබෙන නර්තන අංග දෙකක් ලියන්න. (ල:2)

05. 

i) මෙම රූප සටහනින් දැක්වෙන ආගමික උත්සව නම් කරන්න. (ල:2)

ii) එම උත්සවය සමරනු ලබන රටවල් දෙකක් ලියන්න. (ල:2)

iii) එම රූප සටහනට අදාලව භක්තිකයන් විසින් අනිවාර්යෙන්ම රැකිය යුතු ශීලය කුමක්ද? (ල:2)

iv) එම රූප සටහන්ට අයත් භක්තිකයන්ගේ ශුද්ධ වූ ග්‍රන්ථයේ නම කුමක්ද? (ල:2)

v) මෙම උත්සවය පැවැත්වීම තුළින් ලබා ගත හැකි ආදර්ශයන් දෙකක් ලියන්න. (ල:2)